# පොලිස් මාධ්‍ය කොට්ඨාසය
## பொலிஸ் ஊடகப் பிரிவு
## POLICE MEDIA DIVISION


සුහුරුපාය, බත්තරමුල්ල

තැ.පෙ.අංකය / த. பெ.இ / Po.Box No } 10120

ෆැක්ස් / தொலைநகல / Fax } 011-2171635

දුරකථන / தொலைபேசி / Telephone } 011-2887973 (HUNTING)

වෙබ්.ලිපිනය / இணையதளம் / Web Site } www.Police.lk

ඊ මේල් / மின்னஞ்சல் / E-mail } dir.media@police.gov.lk


මගේ අංකය / எனது இலக்கம் / My NO } / 2024

ඔබේ අංකය / உமது இலக்கம் / Your No } / 2024

දිනය / திக / Date } 01/09/2024 පැය 1520

## මාධ්‍ය නිවේදනය

### 01. මනුෂ්‍ය ඝාතනයක් - කුලියාපිටිය පොලිස් වසම.

2024.08.31 වන දින රාත්‍රී කාලයේ කුලියාපිටිය පොලිස් වසමේ දියදොර ප්‍රදේශයේ පුද්ගලයෙකුට තියුණු ආයුධයකින් පහරදී ඝාතනය කර ඇති බවට කුලියාපිටිය පොලිසියට ලද පණිවිඩයක් මත විමර්ශන ආරම්භ කර ඇත.

**මරණකරු වයස අවුරුදු 31 ක් වූ හග්ගමුව, කුලියාපිටිය ප්‍රදේශයේ පදිංචිකරුවෙකි.**

මරණකරු හා අසල්වැසි පුද්ගලයෙකු සමඟ ඇතිවූ පුද්ගලික ආරවුලක් දුරදිග යාම හේතුවෙන් එම පුද්ගලයා විසින් මෙම ඝාතනය සිදුකර ඇති බවට දැනට සිදුකරන ලද විමර්ශණයේදී අනාවරණය වී ඇත.

මෘත ශරීරය කුලියාපිටිය රෝහලේ මෘත ශරීරාගාරයේ තැන්පත් කර ඇති අතර කුලියාපිටිය පොලිසිය වැඩිදුර විමර්ශන සිදුකරනු ලබයි.

### 02. අයිස් මත්ද්‍රව්‍ය සමඟ සැකකරුවෙකු අත්අඩංගුවට - කොළඹ අපරාධ කොට්ඨාසය.

2024.08. 31 වන දින දහවල් කාලයේ ග්‍රෑන්ඩ්පාස් පොලිස් වසමේ ස්ටේස් මාවත ප්‍රදේශයේ දී කොළඹ අපරාධ කොට්ඨාසයේ නිලධාරීන් විසින් ලද තොරතුරක් මත වැටලීමක් සිදුකර අයිස් මත්ද්‍රව්‍ය **ග්‍රෑම් 08 මිලිග්‍රෑම් 110 ක් සන්තකයේ තබාගෙන සිටි සැකකරුවෙකු** අත්අඩංගුවට ගෙන කොළඹ අපරාධ කොට්ඨාසය වෙත ඉදිරිපත් කර ඇත.

**අත්අඩංගුවට ගත් සැකකරු වයස අවුරුදු 25 ක් වන බෝධිරාජ මාවත ප්‍රදේශයේ පදිංචිකරුවෙකි.**

කොළඹ අපරාධ කොට්ඨාසය වැඩිදුර විමර්ශන සිදුකරනු ලබයි.

## 03. නාඳුනන මළසිරුරක් හමුවීම - කොස්ගොඩ පොලිස් වසම

2024.09.01 වන දින උදෑසන කාලයේ කොස්ගොඩ පොලිස් වසමේ වෙරළ තීරයේ පිරිමි පුද්ගලයෙකුගේ යැයි සැකකරනු ලබන මළසිරුරක් ඇති බවට කොස්ගොඩ පොලිසියට ලද පණිවිඩයක් මත විමර්ශනයක් ආරම්භ කර ඇත.

**මරණකරුගේ අනන්‍යතාවය මෙතෙක් තහවුරු වී නොමැති අතර සිරුරේ හිස කදින් වෙන්ව ඇත. මලසිරුර විකෘති වී ඇති බැවින් මෙය දින ගණනාවකට පෙර මිය ගිය පුද්ගලයෙකුගේ බවට පොලිසිය සැකකරනු ලබයි.**

මෘත ශරීරය පශ්චාත් මරණ පරික්ෂණය සඳහා බලපිටිය මූලික රෝහලේ තැන්පත් කර ඇති අතර කොස්ගොඩ පොලිසිය වැඩිදුර විමර්ශන සිදුකරනු ලබයි.

**පොලිස් මාධ්‍ය කොට්ඨාසය.**